පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.10.18 පැය 1950 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1908/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>**

## 01. ටී-56 වර්ගයේ අවියක් සහ ජීව පතරොම් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීමේ වැඩිදුර වාර්තාව - මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය.

2025.10.17 වන දින හුංගම පොලිස් වසමේදී මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ගිනි අවි සහ මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධ වයස අවුරුදු 38 ක් වන හුංගම ප්‍රදේශයේ පදිංචි සැකකරුවෙකු ටී-56 වර්ගයේ ගිනි අවියක්, එම පතරොම් 63 ක්, පතරොම් ගැබ් 02 ක් සහ බෝර 12 වර්ගයේ පතරොම් යෙදිය හැකි අවි 02 ක්, බෝර 12 වර්ගයේ පතරොම් 25 ක්, රිවොල්වර් වර්ගයේ පතරොම් 34 ක්, ටිපර් රථයක් හා කැබ් රථයක් සමඟ අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන ආරම්භ කර තිබිණි.

සිදු කරන ලද වැඩිදුර විමර්ශනයේදී දැනට රක්ෂිත බන්ධනාගාරගතව සිටින සංවිධානාත්මක අපරාධ හා මත්ද්‍රව්‍ය ජවාරම්කරුවෙකු විසින් මෙම ටිපර් රථය හා කැබ් රථය ලබා දී ඇති අතර, රුපියල් ලක්ෂ 10 ක මුදලක්ද සැකකරු හට ලබා දී ඇති බවට අනාවරණය වී ඇත. මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මඟින් සැකකරු රැඳවුම් නියෝග මත රඳවා තබාගෙන වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. සංජීව කුමාර සමරරත්න නොහොත් ගණේමුල්ල සංජීව නැමැත්තාගේ ඝාතනයට සම්බන්ධ ඉෂාරා සෙව්වන්දි නැමති සැකකාරියට සැඟව සිටීමට ආධාර අනුබල දුන් සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2025.02.19 වන දින අළුත්කඩේ අධිකරණ සංකීර්ණය තුළදී ඝාතනය වූ සංවිධානාත්මක අපරාධකරුවෙකු වූ සංජීව කුමාර සමරරත්න නොහොත් ගණේමුල්ල සංජීව නැමැත්තාගේ ඝාතනයට සම්බන්ධ ඉෂාරා සෙව්වන්දි නැමති සැකකාරියට සැඟව සිටීමට හා පලා යාමට ආධාර අනුබල දුන් සැකකරුවෙකු හා සැකකාරියක් 2025.10.17 වන දින කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් මඟින් අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 45 ක් වන මතුගම ප්‍රදේශයේ හා සැකකාරිය වයස අවුරුදු 26 ක් වන මිද්දෙණිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

සැකකරු හා සැකකාරිය රැදවුම් නියෝග මත රඳවා තබාගෙන කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**